*සැ. යු.* - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,387 - 2024 මැයි මස 31 වැනි සිකුරාදා - 2024.05.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපෑල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 160 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 164 |


*සැ. යු.*- (i) සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත, 2024 මැයි මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) සංශෝධන පනත් කෙටුම්පත, 2024 මැයි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 ජූනි මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජූනි මස 07 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


159- B 082575 — 353 (2024/05)
D 1 -

# පිස්කල් විකිණීම්

## මාරවිල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය

### ප්‍රසිද්ධ පිස්කල් වෙන්දේසියේ විකිණීම

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 53 පරිච්ඡේදය යටතේ, ප්‍රමාණය කරන ලද අලාභ අයකර ගැනීම සඳහා ලඝු කාර්යය පටිපාටිය යටතේ ඉදිරිපත් කරනු ලබන නඩුවකි.

| | | |
|---|---|---|
| අංකය | : | මීගමුව දිසා අධිකරණ නඩු අංක එස්. එම්./960/19 |
| මාරවිල දිසා අධිකරණ ඇස්කීසි අංක | : | 27/2020 |
| වටිනාකම | : | රු. 12,700,000/- |
| පන්තිය | : | 1,000/- |
| ස්වභාවය | : | එස්. එම්. (මුදල්) |
| කාර්ය පටිපාටිය | : | ලඝු කාර්යය පටිපාටිය |

හල්පෙවත්තගේ නිරෝෂන් ප්‍රසාද් පීරිස්,
අංක 145, කට්ටුව,
මීගමුව.

*....................පැමිණිලිකරු.*

*එදිරිව*

ජයලත් ආරච්චිගේ අමිල සම්පත්,
අංක 387/87,
02 වන වීදිය,
නිර්මල මාවත, කටුවපිටිය,
මීගමුව.

*නව ලිපිනය :*

අංක 8/සී,
ඉහල කුඩාවැව,
කුඩාවැව.

*........................විත්තිකරු*

වර්ෂ 2020ක් වූ ජනවාරි මස 16 වැනි දින මෙම නඩුව අවසාන වශයෙන් සුදුස්සක් කිරීම සඳහා මීගමුව දිසා විනිසුරු තැන්පත් දර්ශිකා විමලසිරි මැතිණිය ඉදිරිපිට දී කැඳවන ලද අවස්ථාවේ දී විත්තිකරු වෙත සිවිල් නඩු විධාන සංග්‍රහයේ පළමුවන උපලේඛනයේ 19 වන ආකෘතිය සාරනුකූල සිතාසියක් භාර දී තිබිය දී, විත්තිකරු ගරු අධිකරණය ඉදිරියේ පෙනී නොසිටිය දී සහ විත්තිකරු වෙනුවෙන් නීතිඥ නියෝජනයක් නොතිබිය දී සහ විත්තිකරු ඉදිරිපත්ව විත්තිවාචක ඉදිරිපත් කිරීම සඳහා අවසර ලබා ගැනීමට ඉල්ලීමක් සිදු නොකල බැවින්, පැමිණිලිකරු වෙනුවෙන් නීතිඥ මදූකා දිලානි පෙනී සිටිය දී පැමිණිලිකරු වෙනුවෙන් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල, දිවුරුම් ප්‍රකාශය සහ ලකුණු කරන ලද ලේඛනයන් ද සලකා බලා ගරු අධිකරණය විසින් සෑහීමකට පත්ව මෙම නඩුව පැමිණිලිකරුගේ වාසියට තීන්දු කරනු ලැබූ බවට අණකොට තීන්දු කර ඒ අනුව රුපියල් එක්කෝටි විසිහත් ලක්ෂයක (රු. 12,700,000/-) මුදල ද, නඩු ගාස්තු ද විත්තිකරු විසින් පැමිණිලිකරු වෙත ගෙවිය යුතු බවට අණකොට තීන්දු ප්‍රකාශ කර එකී මුදල් අයකර ගැනීම සඳහා මෙම නඩුවේ දැනට තහනමට ගෙන ඇති සහ ප්‍රසිද්ධ නොතාරිස් දේවිකා ගංගානි විජේසිංහ විසින් 2015.10.06 වැනි දින ලියා සහතික කරන ලද අංක 1188 දින දරන උකස් ඔප්පුව ප්‍රකාරව ලංකා බැංකුව වයික්කාල ශාඛාවට උකසට යටත් මෙහි පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ හා සියලු දේ,

**වර්ෂ 2024ක් වූ ජුනි මස 14 වැනි දින පස්වරු 01.00 ට,**

එකී නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී එනම් අංක 236 සී, කීනකැලේ වත්ත, මුදුකටුව, මාරවිල දරන ස්ථානයේ දී, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වනු ලැබේ.

#### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, දකුණු පිටිගල් කෝරළේ මැද පළාතේ, නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, නාත්තණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 504 බී, පහල මාවිල, ග්‍රාම

නිලධාරි වසමේ මාවිල පිහිටි කීනකැලේවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඩී. කේ. ආර්. පී. පාතේගම විසින් මැන සකස් කරන ලද අංක 4126 සහ 2013.11.02 දිනැති පිඹුර ප්‍රකාර බෙද වෙන් කළ කැබලි අංක 109 දරන කොටසට මායිම් : උතුරට : 4126 පිඹුරේ ලොට් 108 සහ 4123 පිඹුරේ ලොට් ආර් 2 (මීටර් 9ක් පළල පාර) ද, නැගෙනහිරට : 4123 පිඹුරේ ලොට් ආර් 2 (මීටර් 9ක් පළල පාර) සහ 4126 පිඹුරේ ලොට් 110 ද, දකුණට : 4126 පිඹුරේ ලොට් 110 සහ ඇළ (අඩි 1 1/2 පළල) ද, බස්නාහිරට : ඇල සහ 4126 පිඹුරේ ලොට් 108 ද, යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් පහළවක් (පර්. 15) ක් විශාල ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේත් වේ. පෙර ලියාපදිංචි අංක J 175/114 මාරවිල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය.

4126 පිඹුරේ දක්වා ඇති සියලු මාර්ගයන් භාවිතා කිරීමේ මාර්ග පරවේශ්‍යතා අයිතිය ද සමග වේ.

එස්. එම්. වික්‍රමනායක ආරච්චි,
අධිකරණයේ අණ පරිදි,
රෙජිස්ට්‍රාර් තැන,
දිසා අධිකරණය - මාරවිල.

වර්ෂ 2024ක් වූ අප්‍රේල් මස 26 වැනි දින දී ය.

05-295

---

## මොරටුව දිසා අධිකරණයේ දී ය

## සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වැනි වගන්තියට එකඟව පිස්කල් විසින් කරනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ දැන්වීම

| | | |
|---|---|---|
| *නඩු අංකය* | : | 46/2018 DR |
| *ස්වභාවය* | : | ණය ආපසු අයකර ගැනීම |
| *වටිනාකම* | : | රු. 5,201,596/- |
| *ක්‍රියා පටිපාටිය* | : | ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ නියමිත විශේෂ |
| *ඇස්කීසි අංකය* | : | 02/2024 (මාරවිල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය) |

1994 අංක 09 දරන සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4(1) වගන්තිය යටතේ පවරන ලද නඩුකරය.

සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්, (කලින් ''දේශෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ්'' යනුවෙන් නම් කර හඳුන්වනු ලැබූ)
''අර්ථධර්ම කේන්ද්‍රය'', අංක 45, රාවතාවත්ත පාර, මොරටුව.
(සමාගම් අංකය : පී. බී. 3795)

.................*පැමිණිලිකරු.*

*එදිරිව*

01. අන්තෝනි පෙරේරාගේ තුසිත නිරෝෂන් පෙරේරා,
අංක 310, මැද කිරිමැටියාන,
ලුණුවිල.

02. ජයකොඩි ආරච්චිගේ ඉන්ද්‍රානි *නොහොත්*
ජයකොඩි ආරච්චිගේ ඉන්ද්‍රානි ජයකොඩි,
සමුපකාර මාවත, මැද කිරිමැටියාන,
ලුණුවිල.

03. රත්නායක මුදියන්සේලාගේ පාලිත සුනිල් පුෂ්පකුමාර,
අංක 62/සී/1, මිල්ලගහවත්ත,
තෙරේසා පාර, උතුරු කටාන,
කටාන.

04. ලියන ආරච්චිගේ මනෝජ් කුමාර ඒකනායක,
අංක 11/30ඒ, ෆාතිමා පාර,
කොච්චිකඩේ.

......................*විත්තිකරුවන්.*

මොරටුව දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2023ක් වූ නොවැම්බර් මස 16 වැනි දිනැතිව ලබා දෙන ලද නියත තීන්දු ප්‍රකාශය ප්‍රකාරව විත්තිකරුවන් විසින් ශ්‍රී ලංකා මුදලින් රුපියල් පනස් දෙලක්ෂ එක්දහස් පන්සිය අනූ හයක (රු. 5,201,596/-) ක මුදලක් සහ (රු. 4,954,230/-) ක මුදලක් මත 2017.09.21 වැනි දින සිට තීන්දු ප්‍රකාශ දින දක්වා වර්ෂයකට 22.5% බැගින් පොළිය සහ ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ දින සිට සම්පූර්ණයෙන් ගෙවා අවසන්වන තෙක් එම අනුපාතිකය මත ම පොළිය ද, නඩු ගාස්තු ද පැමිණිලිකාර සමාගමට 01 වන සහ 02 වන විත්තිකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා මාරවිල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ 2024.01.16 වැනි දින තහනමට ගෙන ඇති පහත සඳහන් උපලේඛනයේ මැනවින් විස්තර කර ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2024ක් වූ ජුනි මස 26 වැනි දින ප. ව. 2.00 ට**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මින් දැනුම් දෙනු ලැබේ.

*උපලේඛනය*

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කොටසට අයත් දකුණු පිටිගල් කෝරලේ, ඔිතර පළාතේ, දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දන්කොටුව ප්‍රාදේශීය සභා සීමාව තුළ, මැද කිරිමැටියාන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි, ඉඹුල්ගහවත්ත *හෙවත්* කිරිදිවුල්ගහවත්ත කියන ඉඩමෙන් අංක 2013 පිඹුරේ ප්‍රකාර කැබලි අංක 03 දරන ඉඩම් කොටසට මායිම් :

*උතුරට* : ඉහත කී සිතියමේ කැබලි අංක 02 ද ;
*නැගෙනහිරට* : ප්‍රාදේශීය සභා පාර ද ;
*දකුණට* : ඒ. පී. ධම්මික පෙරේරාගේ ඉඩම ද ;
*බස්නාහිරට* : අයි. ගුණසේකරගේ ඉඩම ද

යන මායිම් තුළ පිහිටි පර්චස් දහනවයයි දශම හතර (19.4) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේ ද වේ. (පෙර ලියාපදිංචිය : E 213/114)

*දේපලට පිවිසීම.*- මාරවිල සිට නාත්තණ්ඩිය දෙසට පැමිණ දංකොටුව පාරට හරවා කි. මී. 10 ක් පමණ දුරින් කිරිමැටියාන හංදියට පැමිණ වමට හරවා (තුලාවල පාරට) මී. 200 ක් පමණ දුරින් පිහිටි සමුපකාර මාවතෙ හි දකුණු පසට වන්නට එකී දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*-

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25%ක් එදින ම ගෙවිය යුතු ය.
2. ඉතිරි 75%ක මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී මාරවිල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ ඇස්කීසි අංකය යටතේ තැන්පත් කළ යුතු ය.
3. සියලුම වියදම් ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ විගස ම මුදලින් ගෙවිය යුතු ය. (චෙක්පත් භාරගනු නොලැබේ.)
4. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 (ආ) වගන්තිය ප්‍රකාරව වෙන්දේසි ගාස්තු ගෙවිය යුතු ය.

එස්.එම්. වික්‍රමනායක ආරච්චි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
මාරවිල.

වර්ෂ 2024ක් වූ මැයි මස 13 වැනි දින දී ය.

05-294

**කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

නඩු අංකය : CHC/Civil/55/2018/MR
ඇස්කීසි අංකය : 27/2024
ස්වභාවය : උගස්
වටිනාකම : රු. 12,386,229.88/-
ක්‍රියා පටිපාටිය : සාමාන්‍ය

එලායන්ස් ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී.,
අංක 84, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

*...................පැමිණිලිකරු.*

*එදිරිව*

01. සජානි ඉන්ෆිනිටි ග්‍රොත් ප්‍රයිවට් ලිමිටඩ්,
අංක 67, දෙහිවල පාර,
බොරලැස්ගමුව.

*නව ලිපිනය :*

අංක 180, මීගමුව පාර, මල්කඩුවාව, කුරුණෑගල.

*.....................විත්තිකරු.*

කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවේ 2020ක් වූ ඔක්තෝබර් මස 07 වැනි දින ඇතුළත් කරන ලද ඒක පාර්ශ්වික තීන්දු ප්‍රකාශය අනුව, 01 වන විත්තිකරුට විරුද්ධව තීන්දු ප්‍රකාශ කර ඇති අතර,

1 වන විත්තිකරු විසින් පැමිණිලිකරුට,

(*අ*) ඉහත විත්තිකරු පැමිණිලිකාර සමාගමට රුපියල් දොළොස් මිලියන තුන් ලක්ෂ අසූහය දහස් දෙසිය විසි නවයයි ශත අසූ අටක (රු. 12,386,229.88) මුදල හා ඒ මත පොළිය ගෙවීම පැහැර හැර ඇති බවට හා එම මුදල් ගෙවීමට බැඳී ඇති බවට නඩු තීන්දුවක් ලබාදෙන ලෙසටත්,

(*ආ*) විත්තිකරු ඉහත රුපියල් දෙළොස් මිලියන තුන් ලක්ෂ අසූහය දහස් දෙසිය විසි නවයයි ශත අසූ අටක (රු. 12,386,229.88) යන මුදල හා නෛතික පොළිය පියවීමේ සුරක්ෂිතයක් ලෙස පැමිණිලිකරු වෙත ලබා දී ඇති ඉහත ප්‍රසිද්ධ නොතාරිස් ටී. ඩී. එෆ්. ඒ. ගුණවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 1769 දරන උකස්කරය නීතිය ඉදිරියේ ක්‍රියාත්මක කරගැනීම සඳහා නියෝගයක් ලබා දෙන ලෙසට ත්,

(*ඇ*) නඩු ගාස්තු ලබාදෙන ලෙසට ත්,

තව ද, විත්තිකරු මේ වනතුරු අප ආයතනය වෙත කිසිදු මුදලක් ගෙවා නොමැති බැවින්, පැමිණිල්ලේ ආයාචනයේ ඉල්ලා ඇති සහන ලබා ගැනීම සඳහා ඇස්කීසි ක්‍රියාත්මක කිරීමට ඇති බවත්, දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් වන විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2024ක් වූ ජුනි මස 19 වැනි දින ප. ව. 12.30 ට**

ඉහත නම් සඳහන් වන විත්තිකරුගේ නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, තිරගන්දහය කෝරළේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ කුරුණෑගල ප්‍රාදේශීය සභා මායිම් තුළ, බමුණාවල 815 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පල්ලේ කුමාබල්පොල සහ බමුණාවල හෙරලියාවල මල්කඩුවාව පිහිටි ''මල්කඩුවාව වත්ත'' නැමති ඉඩම බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් මැන සාදන ලද අංක 1990 සහ 1990.02.12, 14 සහ 22 දින

දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 36 A කැබැල්ලට මායිම් : උතුරට : ලොට් 36 B ද, නැගෙනහිරට : ලොට් 18 ද, දකුණට : කුරුණෑගල නාරම්මල ප්‍රධාන පාර ද, බටහිරට : නිවෙස්වලට යන පාර වෙන් කෙරෙන තාප්පය යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් හතලිහයි දශම බිංදුවයි හතරයි හතක (පර්. 40.047) විශාලත්වය ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේ ද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 129/45 හි ලියාපදිංචි වී ඇත.

ඉහත විස්තර කරන ලද ඉඩම නැවත මැනීමකට අනුව පහත විස්තර කෙරේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, තිරගන්දහය කෝරළේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ කුරුණෑගල ප්‍රාදේශීය සභා මායිම් තුළ, බමුණාවල 815 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පල්ලේ කුමාබල්පොල සහ බමුණාවල හෙරලියාවල මල්කඩුවාව පිහිටි ''මල්කඩුවාව වත්ත'' නැමති ඉඩම බලයලත් මිනින්දෝරු ඩී. ජේ. බන්දුතිලක විසින් මැන සාදන ලද අංක 23138/2015 සහ 2015.06.11 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 1 කැබැල්ලට මායිම් : උතුරට : ලොට් 36 B ද, නැගෙනහිරට : ලොට් 18 ද, දකුණට : කුරුණෑගල නාරම්මල ප්‍රධාන පාර ද, බටහිරට : නිවෙස්වලට යන පාර වෙන් කෙරෙන තාප්පය යන මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් බිංදුවයි දශම බිංදුවයි හතරයි හතක (රූඩ් 1, පර්. 0.047) විශාලත්වය ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේ ද වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 129/45 හි ලියාපදිංචි වී ඇත.

ජී. එච්. එම්. සී. ගෙදරගොඩ,<br>
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,<br>
දිසා අධිකරණය,<br>
කුරුණෑගල.

2024 ක් වූ අප්‍රේල් මස 29 වැනි දින දී ය.

05-306

---

# විවිධ දැන්වීම්

## ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් (කොළඹ දී පවත්වනු ලබන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

නඩු අංකය : CHC/88/2023/CO<br>
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම

ගම්පොල, ජයමාලපුර, නාවලපිටිය පාරේ, අංක 367/58 දරන ස්ථානයේ, 2 වන මහලේ ලියාපදිංචි කාර්යාලය පිහිටි අංක (PV 8924) දරන එලීෂියන් මිරිස්ස (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම (සංශෝධිත) 2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටසේ 270 වන වගන්තිය යටතේ සහ එය ප්‍රකාරව අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

ජේම්ස් සුනිමල් සල්ගාදු,<br>
අංක 168/6, ශ්‍රී ජයසුන්දර මාවත,<br>
නුගේගොඩ.

......................*පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් සමාගම ගණන් හිලව් බේරා වසා දැමීම සඳහා සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය වෙත 2023 ඔක්තෝබර් 20 වැනි දින පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එම පෙත්සම 2024 ජූලි මස 23 දින අධිකරණය ඉදිරියේ දී ඇසීමට නියමකර ඇති බවත්, මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම පෙත්සම පිළිබඳව නියෝගයක් ලබා දීමට කැමති හෝ ඊට විරුද්ධවන ඕනෑම ණය හිමියෙකුට හෝ එකී සමාගමෙහි දායකයකුට නඩුව කැඳවන අවස්ථාවේ දී පුද්ගලිකව හෝ සිය නීතිඥවරයා මාර්ගයෙන් පෙනී සිටිය හැකි අතර, පෙත්සමෙහි පිටපතක් එය අවශ්‍ය කෙරෙන ඕනෑම ණය හිමියෙකුට හෝ එකී සමාගමෙහි දායකයෙකු වෙත ඒ සඳහා වන නියමිත ගාස්තු ගෙවීමෙන් පසුව පහත අත්සන් තබා ඇති අය විසින් ලබා දෙනු ඇත.

*අත්සන් කළේ :* ඒ. ඩී. ශ්‍යාමලි අයි. අතුකෝරල,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 166/1, අලුත්කඩේ වීදිය,
කොළඹ 12.

***සටහන.-*** එකී පෙත්සම කැඳවනු ලබන අවස්ථාවට පෙනී සිටීමට කැමැත්තක් දක්වන ඕනෑම පුද්ගලයෙකුට ඔහු එසේ කැමැත්තෙන් සිටින බව ඉහත නම් සඳහන් පෙත්සම්කරුගේ නීතිඥවරයා වෙත ලිඛිතව තැපෑලෙන් දැන්විය යුතුය. *නැතහොත්* ගෙනැවිත් භාරදිය යුතුය. එම නිවේදනයෙහි පුද්ගලයාගේ නම ලිපිනය සහතික කළ යුතුය. එසේ නැතහොත් තම නීතිඥවරයා (සිටී නම්) මාර්ගයෙන් භාරදිය යුතුය. තැපෑලෙන් එවනු ලබන්නේ නම් **2024 ජූලි මස 22 වැනි දින පස්වරු 6.00 ට** පෙර ඉහත නම් සඳහන් අය වෙත ලැබෙන පරිදි එවිය යුතු ය.

05-313

---

## පාර්ලිමේන්තුව

### අල්-හාෂිම් සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

සෙය්යිඩ් අලී සාහීර් මවුලානා වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "අල්-හාෂිම් සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංගමය සංස්ථාගත කිරීමයි :-

*(අ)* සුදුසු යැයි සැලකෙන සියලු දෙනාගේ ජීවන තත්ත්වය උසස් කිරීමට උපකාර කිරීම ;

*(ආ)* අප අතර සිටින අසරණයන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා, සෞඛ්‍ය සේවා අවශ්‍යතා සහ එදිනෙද ජීවිතයේ අනෙකුත් මූලික අවශ්‍යතා කෙරෙහි ඔවුන්ගේ බැඳීම් ඉටුකිරීමට උපකාර කිරීම ;

*(ඇ)* ඔවුන්ගේ සමාජ සහ අධ්‍යාපනික තත්ත්වයන්ට ගැලපෙන රැකියා ලබාගැනීමට සහාය වීම

යනාදිය වේ.

සෙය්යිඩ් අලී සාහීර් මවුලානා,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
මඩකලපුව දිස්ත්‍රික්කය.

05-307

## පාර්ලිමේන්තුව

### ''ජීකේ පදනම'' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ගෝවින්දන් කරුණාකරම් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ "ජීකේ පදනම'' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ''ජීකේ පදනම'' සංස්ථාගත කිරීමයි :-

1. පෙර පාසල් අවධියේ සිට විශ්වවිද්‍යාල මට්ටම දක්වා අධ්‍යාපන අවස්ථා ලබා ගැනීමට සියලුදෙනා හට මග පෙන්වීම සහ විශේෂයෙන් දුෂ්කර ගම්මානවල කෘෂිකර්මාන්තය, ඉංජිනේරු විද්‍යාව, වෛද්‍ය විද්‍යාව සහ නීති අධ්‍යාපනය යන විෂය ධාරාවන්හි ඉගෙනීමට උද්යෝගිමත් පුද්ගලයන් ඒ සඳහා පෙළඹවීම ;

2. දිළිඳුබව සහ සාගින්න තුරන් කිරීම සඳහා වූ වැඩසටහන් සඳහා ජනතාව පෙළගැස්වීම තුළින්, ඔවුනට සකසුරුවම්කම, ඉතිරි කිරීම සහ ස්වයං රැකියා සම්බන්ධයෙන් දැනුවත්භාවයක් ලබාදීම ;

3. පවුලේ සාමාජිකයෙකුගේ හදිසි වියෝව නිසා විපතට පත් වන්නා වූ එම පවුලේ සෙසු සාමාජිකයින්ට සහන සැලසීම සහ එම අවමංගල්‍ය කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය උපරිම සහාය ලබාදීම

යනාදිය වේ.

ගෝවින්දන් කරුණාකරම්,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
මඩකලපුව දිස්ත්‍රික්කය.

05-312

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.